# ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

## කම්කරු අමාත්‍යාංශය

**( ද්විතීයන පදනම මත - වසර දෙකක් සඳහා )**

කම්කරු අමාත්‍යාංශයට අනුබද්ධිත හා 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් ස්ථාපිත ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ පහත සඳහන් තනතුර සඳහා පවතින පුරප්පාඩුව වෙනුවෙන් ඒ යටතේ දක්වා ඇති සුදුසුකම් සපුරන්නන් වෙතින් ද්විතීයන පදනම මත සේවය කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරන අයදුම්කරුවන් අතරින් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

**01. අධ්‍යක්ෂ ජනරාල් - තනතුරු 01**

(අ) සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර ( HM 2-1)

(ආ) තනතුරට පැවරෙන කාර්යයන්

ආයතනයේ පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීමේ කාර්යය ආයතනික ව්‍යුහය හරහා ඉටු කිරීමේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයා එම සමස්ථ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පාලක මණ්ඩලයට වගකිව යුතු වේ. ඒ අනුව පාලක මණ්ඩලයේ මෙහෙයවීම හා පාලනය යටතේ පාලක මණ්ඩලය විසින් පවරා දෙනු ලබන කාර්යයන්, බලතල ක්‍රියාත්මක කරමින් ආයතනයෙහි සෙසු කාර්ය මණ්ඩලය සඳහා මඟ පෙන්වමින්, නායකත්වය දෙමින් හා දිරිගන්වමින් ආයතනික සමස්ථ අරමුණ ඉටු කිරීම මෙම තනතුරට පැවරෙන කාර්යයන් වේ.

(ඇ) වැටුප්

නිත්‍ය තනතුරට අදාළ සම්පූර්ණ පාරිශ්‍රමිකය හා ද්විතීයන පදනම මත වැඩ බලන තනතුරට අදාළ ආරම්භක වැටුපෙන් ¼ ක ද්විතියන දීමනාවක්.

(ඈ) සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ කලා/ නීති විෂය ක්ෂේත්‍රයකින් මූලික උපාධියක් ලබා තිබීම

සමඟ

විද්‍යා/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ කලා/ නීති හෝ වෙනත් අදාල විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සේවයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 20 ක පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර 05 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. )

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යා/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ කලා/ නීති විෂය ක්ෂේත්‍රයකින් මූලික උපාධියක් ලබා තිබීම

සමඟ

විද්‍යා/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ කලා/ නීති හෝ වෙනත් අදාල විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම

සහ

ආචාර්ය උපාධියක් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 05ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද ලබා තිබීම.

(ඉ) වයස - අවු:35 ට නොඅඩු හා අවු:55 ට නොවැඩි විය යුතු ය.

**02.** **බඳවා ගැනීමේ ක්‍රමවේදය**

පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනීමෙන් පසු බඳවා ගනු ලැබේ.

**03. වෙනත්**

**(අ) සෑම ඉල්ලුම්කරුවෙක්ම**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන මනා යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**(ආ) සේවා ස්ථානය**

නාරාහේන්පිට කම්කරු මහලේකම් කාර්යාලයේ දෙවන මහලෙහි පිහිටා ඇති ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සේවා ස්ථානය වේ.

**04. අයදුම් කිරීමේ ක්‍රමය**

මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනය ගනිමින් අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද, ඉතිරිය අනෙක් පිටුවලට ද වන ලෙස සකස් කළ අයදුම්පතක් සම්පූර්ණ කර අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් සනාථ කළ හැකි සහතික පිටපත් සමඟ අයදුම්පත් යොමු කළ යුතු වේ. තවද, දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මඟින් යොමු කළ යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන හා සහතික පිටපත් අමුණා නොමැති අයදුම්පත් හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කර 2025.08.14 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් ලැබීමට සැලැස්විය යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසු ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පාලක මණ්ඩලය සතු වේ.


දුරකථන අංකය - 0112 786541
ඊ මේල් nilsprocurementunit@gmail.com
වෙබ් අඩවිය www.nils.gov.lk

**අධ්‍යක්ෂ ජනරාල්**
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
2 වන මහල
කම්කරු මහලේකම් කාර්යාලය
කොළඹ 05